# පිට්ටනිය







# ජීවන්, තිලංග හා ශ්‍රී ලංකාවේ ක්‍රිකට්

ලෝක කුසලානය සමඟ ශ්‍රී ලංකාවට ගලා ආවේ ගෞරවය පමණක් නොවේ. ඩොලර් ලක්ෂ ගණනින් මුදල් ද ශ්‍රී ලංකාව වෙත ගලා ආවේය. මේ මහා ධන උල්පත දුටු බොහෝ දෙනෙක් ක්‍රිකට් පරිපාලනයට සම්බන්ධ වීමට උත්සුක වූහ.

ඒ අප්‍රේල් මාසයේ අග හරියේ දවසකි. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයෝ කොළඹ මෙට්ලන්ට්ඩ් පෙදෙසේ පිහිටි එස්.එස්.සී ක්‍රීඩාංගණයට පැමිණියහ. නවසීලන්ත සංචාරය නිමවා පැමිණි ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ අබුඩාබියේ පැවති එක්දින තරඟාවලිය සඳහා පෙර පුහුණුව ලැබීමය.

එහෙත් එහිදී ඔවුන්ට මුහුණ දීමට සිදුවූයේ නොසිතූ විරූ අකරතැබ්බයකටය. ලොව කිසිදු ජාතික ක්‍රිකට් කණ්ඩායමක ක්‍රීඩකයන්ට මින් පෙර එවන් අකරතැබ්බයකට මුහුණ දීමට සිදු නොවන්නට ඇත. මෙම අකරතැබ්බය නම් පුහුණුවීම් සඳහා අවශ්‍ය පන්දු නොතිබීමය.

බැලූ බැල්මට මෙය හාස්‍ය උපදවන කාරණයකි. එහෙත් මේ කතාව පසුපස ඇත්තේ දේශපාලනමය, බලලෝභී, ආත්මාර්ථකාමී ක්‍රියාදාමයකි. ඒ ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ විනාශ වීම මෙහි ඇති වඩාත් අවාසනාවන්ත තත්වයය.

ශ්‍රී ලංකාව 1996 ලෝක කුසලානය දිනා ගන්නට පෙර ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනය ගැන වැඩි පිරිසක් උනන්දු වූයේ නැත. ඊට හේතුව වූයේ එය කාලය, ශ්‍රමය පමණක් නොව පෞද්ගලික ධනයද වැය කරමින් කළ යුතු වූ ගෞරවනීය කටයුත්තක් වීමය. ඒ හෙයින්ම 1996ට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනයට සම්බන්ධ වූවෝ දේශපාලඥයෝ වූහ. ඔවුහු තමතමන් නියලි ක්ෂේත්‍රයන්ට ආලෝකයක් ලබා ගන්නට ක්‍රිකට් පරිපාලනය මෙවලමක් කොට ගත්හ. එහෙත් 1996 ලෝක කුසලාන ජයග්‍රහණයත් සමඟ තත්වය මුළුමණින්ම වෙනස් විය.

ලෝක කුසලානය සමඟ ශ්‍රී ලංකාවට ගලා ආවේ ගෞරවය පමණක් නොවේ. ඩොලර් ලක්ෂ ගණනින් මුදල් ද ශ්‍රී ලංකාව වෙත ගලා ආවේය. මේ මහා ධන උල්පත දුටු බොහෝ දෙනෙක් ක්‍රිකට් පරිපාලනයට සම්බන්ධ වීමට උත්සුක වූහ. දේශපාලඥයෝ ව්‍යාපාරිකයෝ ආදී විවිධ තලවල පුද්ගලයෝ ඒ අතර වූහ. ඒ සමඟම ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනය යුධපිටියක් බවට පත්විය.

එතෙක් මහත්මා ස්වරූපයෙන් පැවති ක්‍රිකට් ක්‍රීඩා සංගම් නිලවරණය මැරයන්ගෙන් පිරුණු සටන් බවට පත්විය. ඊට අමතරව අවස්ථා දෙක තුනකදීම නිලවරණ සඳහා මැදිහත් වීමට අධිකරණයට සිදුවිය. අවසානයේ ක්‍රීඩා ඇමතිවරයාට සංගම් ගෙදර යවා අතුරු කමිටු පත්කරන්නට සිදුවිය. මේ සියල්ල සිදුවූයේ අන් කිසිවක් නිසා නොව පෙර සඳහන් කළ දේශපාලනය, බලලෝභී බව හා ආත්මාර්ථකාමී බව නිසාය.

මෙහි අලුත්ම ප්‍රතිඵලය වී ඇත්තේ වර්තමානයේ ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනය තුළ හටගෙන ඇති මහා අවුලය. ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය පසුගිය වතාවේ සිටි පාලකයෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ලෙස වෙනස්කමකට භාජනය කළහ. ඔවුහු එය හඳුන්වා දුන්නේ නව ලෝකයට ගැලපෙන ලෙස නම වෙනස් කරනවා යනුවෙනි. එහෙත් ඔවුන් කළේ කුමක්දැයි වැටෙහෙන්නේ දැන්ය.

පරිපාලනයේ අවුල් සහගත බව හේතුවක් කර ගනිමින් ක්‍රීඩා අමාත්‍ය ජීවන් කුමාරතුංග උපන් හැටියේම සිටි ක්‍රිකට් ආයතනයේ නව පරිපාලනය විසි-රුවා හැරියේය. ඒ වෙනුවට අතුරු කමිටුවක් පත් කළේය. ජීවක් කුමාරතුංග ඇමතිවරයාගේ මෙම තීරණයට හේතුව ආණ්ඩුවේ දේශපාලන ප්‍රශ්නයක් යැයි ඇතැම්හු කියති. එය එසේ වන්නට ද පුළුවන. නොවන්නට ද පුළුවන. එහි හරි වැරැද්ද කෙසේ වෙතත් අප දන්නා නීතියට අනුව එම තීරණය ගන්නට ක්‍රීඩා අමාත්‍යවරයාට හැකියාව තිබේ.

එහෙත් මෙවර මේ තීරණයට එරෙහිව බලපෑම් කිරීමට හිටපු ක්‍රිකට් පරිපාලකයන්ට අවස්ථාව උදා විය. එහිදී ඔවුන්ට මහත් පිටුබලයක් වූයේ මුලින් කර තිබූ නම වෙනස් කිරීමය. ඒ නිසා නීතියේ හිඩැස් අතරින් රිංගා යන්නට ඔවුන්ට හැකි විය.

කෙසේ වෙතත් මේ සියලු තත්වයන්ගේ අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු බලධාරීන් හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පත්කළ අතුරු පාලක කමිටුව අතර තෙරපීමට ලක්වීමය.

උදාහරණයක් ලෙස කියනවා නම් නවසීලන්තයේ සිට පැමිණි ශ්‍රී ලංකා කණ්ඩායමට ක්‍රිකට් ආයතනයට ඇතුළු වීමට, එහි පුහුණුවීම් කිරීමට, ඊට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලකයන් පස්සේ යාමට සිදුවිය. එහෙත් කණ්ඩායම නම් කිරීම, නායකයන් තීරණය කිරීම ආදී කටයුතු සිදුකළ යුතු වූයේ අමාත්‍යවරයා විසින් පත්කළ අතුරු කමිටුව හරහාය.

මෙහිදී ක්‍රිකට් ක්‍රීඩකයෝ අන්ත අසරණ වූවා යැයි කියතොත් වඩා නිවැරදිය. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලකයන් සමඟ ගනුදෙනු නොකළ යුතු යැයි අතුරු පාලක කමිටුවේ නිලධාරීහු ක්‍රීඩකයන්ට තර්ජනය කළහ. අතුරු පාලක කමිටුව සමඟ ගනුදෙනු නොකරන්නැයි ක්‍රිකට් ආයතනයේ හිටපු පරිපාලකයෝ බලපෑම් කළහ.

අබුඩාබි සංචාරය සඳහා මෙම අවුල තාවකාලිකව සමනය කළද එය පැලැස්තරයක් පමණි. තව දින කීපයකින් මෙය මහා වියවුලක් වීමට ඉඩ තිබේ. මෙහි පාඩුව සිදුවන්නේ ජීවන් කුමාරතුංග ඇමතිවරයාටවත්, හිටපු සභාපති තිලංග සුමතිපාල ඇතුළු බලධාරීන්ටවත් නොවේ. සමස්ත ශ්‍රී ලංකා-වටමය. නම කැත වන්නේ ගුණත්වයෙන් බාල වන්නේ ශ්‍රී ලංකාව හා එහි ක්‍රිකට් ක්‍රීඩාවය. මෙම තත්වය ගැන පෙර කී බලධාරීන්ට වැටහීමක් නැත. අනෙක් අතට ඔවුන්ට ඒ ගැන උවමනාවක් ද නැත. ඔවුන්ට අවශ්‍ය වන්නේ තමතමන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරවා ගැනීමය.

මෙවන් තත්වයක් වෙනත් රටක නිර්මාණය වූවා නම් එම රටේ මාධ්‍ය ආදී පාර්ශව මෙම වැරදි නිවැරදි කොට රට වෙනුවෙන් කතා කරනු දැකිය හැකිය. එහෙත් අවාසනාවකට ශ්‍රී ලංකාවේ එවන් තත්වයක් ක්‍රියාත්මක වන්නේ ද නැත. ඊට හේතුව වන්නේ මාධ්‍ය ආදී පාර්ශවද ඒ ඒ පිරිස්වලට අයත් වීම හා ඔවුන්ගේ අතින් නැටවීමට ලක්වීමය.

**සුරංජන් වික්‍රමසිංහ**




